## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(8 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 8 ශ්‍රේණිය- දෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **8 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 01 - නාට්‍ය හා රංග කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.4 තෝරාගත් නාට්‍ය පෙළක සතර අභිනය භාවිත කළයුතු ආකාරය විමසයි. | • සතර අභිනය නිර්වචනය කරයි.<br>• වාචික , ආංගික,සහ සාත්වික අභිනයට අදාළ විශේෂතා පැහැදිලි කරයි. | සතර අභිනය නිර්වචනය කිරීම.<br>සතර අභිනයට අදාළ මූලික ලක්ෂණ පැහැදිලි කිරීම. | 1.4.1 - සතර අභිනය භාවිතය | 01 |
| 02 - ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයේ යෙදෙයි. | 2.4 චරිත අභ්‍යන්තරය ඉස්මතු වන සේ රූපණයේ යෙදෙයි. | 1. නාට්‍ය පෙළට අදාළ චරිත තෝරා ගනියි.<br>2. ඒ ඒ චරිතවල ලක්ෂණ පිළිබඳ විමසයි.<br>3.චරිතවල අභ්‍යන්තර සහ බාහිර ලක්ෂණ විමසමින් ගැලපෙන නලුවන් තෝරයි. | නාට්‍ය පෙළෙහි චරිතවලට ගැලපෙන අයුරින් වඩාත් ගැලපෙන නළු නිළියන් තෝරා ගැනීම. | 2.4.1 - චරිතයට ඔබින නළුවන් තෝරමු. | 01 |
| | | 4. නාට්‍ය පෙළෙහි චරිත නිරූපණයට අදාළ රූපණය පිළිබඳ පුහුණුව ලබයි. | එම නළු නිළියන් චරිත සතර අභිනයෙන් රැපණය කිරීම සම්බන්ධ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම. | 2.4.2 - තේරුණු නළුවන් සමගින් පෙළ රූපණයෙන් සරසමු. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.5 පරිකල්පනය වර්ධනය වන ක්‍රියාකාරකම්හි යෙදෙයි. | 1. පරිකල්පනය යනු කුමක්ද යන්න අර්ථ කථනය කර ගනියි.<br>2. යම් තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවීමට උත්සාහ දරයි.<br>3. පරිකල්පනය මගින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි. | පරිකල්පනය පිළිබඳ කේවල සහ සාමූහික වශයෙන් ක්‍රියාකාරකම්හි සිසුන් යෙදවීම. | 2.5.1 - තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු.(සාමූහික සහ කේවල) | 02 |
| | 2.6 නිර්මාණාත්මක චින්තනය වර්ධනය වෙයි. | - නාට්‍යයෙහි කතා පුවත වටහාගනියි.<br>2. තේමාව ,සංවාද සහ චරිතවල ස්වභාවය අධ්‍යයනය කරයි.<br>3. පෙළෙහි ඇති විවිධ සිදුවීම් විස්තර කරයි. | නාට්‍යයකට ගැලපෙන කතා තෝරා ගැනීම | 2.6.1 - අභිමත කතාවක් තෝරා ගනිමු. | 01 |
| | | • තෝරාගත් කතාව ඇසුරින් නාට්‍ය සිද්ධි ගොඩනගයි.<br>• නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණ අධ්‍යයනය කරයි. | නාට්‍ය සිද්ධි නිර්මාණය<br>නාට්‍යෝචිත සිද්ධිවල ලක්ෂණ අධ්‍යයනය | 2.6.2 - එහි නාට්‍යෝචිත අවස්ථා තෝරාගනිමු | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • සංවාද ගොඩ නගමින් පෙළ රචනයේ යෙදෙයි. | පෙළරචනයක ලක්ෂණ අධ්‍යයනය කරමින් පෙළ රචනය | 2.6.3 - පෙළක් රචනා කරමු. | 02 |
| | 2.7 වේෂභූෂණ නිර්මාණය කරයි. | • වේෂභූෂණ පිළිබඳ අධ්‍යයනයක යෙදෙයි.<br>• වේෂභූෂණ සැලසුම් කරමින් නිර්මාණය කරයි.<br>• වේෂභූෂණ සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරයි. | විවිධ ශෛලීන්ට අයත් වේෂභූෂණ හඳුනාගැනීම.<br>වේෂභූෂණ සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු<br>වේෂභූෂණ සැලසුම්කරණය සහ නිර්මාණකරණය | 2.7.1 රචනා කර නාට්‍යයට උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය | 01 |
| 03 - නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.5 නාට්‍ය ගීත ගායනා කරයි. | • නාට්‍ය ගීත එක්රැස් කරයි.<br>• නාට්‍ය ගීතවල නාදමාලා අධ්‍යයනය කරයි.<br>• භාවාත්මකව ගයමින් රංගනය කරයි. | නාට්‍ය ගීත හඳුනාගැනීම.<br>නාදමාලා අධ්‍යයනය<br>ගීතවල අර්ථය අනුව රංගනය | 3.5.1 - භාවාත්මකව නාට්‍ය ගී ගයමු | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 - නාට්‍ය හා රංග කලාවට හා සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.4 එම නාට්‍යවල ඇති සංස්කෘතික, සාමාජික හා විද්‍යාත්මක අගය පිළිබඳ ව විමසයි. | • ආගමික නාට්‍යවල අගයන් පැහැදිලි කරයි.<br>• ආගමික නාට්‍යවලින් මතුවන සංස්කෘතික ලක්ෂණ විමසයි. | ආගමික නාට්‍යවල සංස්කෘතික ලක්ෂණ හා<br>සාමාජීය වටිනාකම්<br>පිළිබඳ සාකච්ඡා කිරීම. | 4.4.1 - ආගමික තේමා රැගත් නාට්‍යවල සංස්කෘතික හා සාමාජීය අගයන් විමසමු. | 01 |
| | | • ආගමික උත්සව සඳහා නාට්‍ය නිර්මාණය කරයි.<br>• එම නාට්‍ය නිර්මාණයට අදාළ වේෂභූෂණ සහ නාට්‍යෝපකරණ සැලසුම් කරයි. | ආගමික නාට්‍ය සකස් කිරීමේ අරමුණු පැහැදිලි කිරීම.<br>සංවාද ගොඩනගමින් නාට්‍ය අවස්ථා නිර්මාණය<br>සුදුසු වේෂභූෂණ සහ රංගභාණ්ඩ නිර්මාණය | 4.4.2 - ආගමික කතා ඇසුරින් නාට්‍ය නිර්මාණය කරමු. | 02 |
| | 4.5 විවිධ ආගමික උත්සවවල දී උක්ත නාට්‍ය ප්‍රදර්ශනය කරයි. | • සිරිත් මල්දමෙහි කවි ගායනයේ යෙදෙයි.<br>• එහි කවිවල අන්තර්ගත කරුණු විමසයි.<br>• එම කවිවල අර්ථ අනුව රංග අවස්ථා නිර්මාණය කරයි. | සිරිත් මල්දම අධ්‍යයනය<br><br>අර්ථ අනුව රංග අවස්ථා නිර්මාණය | 4.5.1 - සිරිත් මල්දම ඇසුරින් නාට්‍ය හදමු. | 02 |